සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

15080

නර්තනය - (දේශීය) I
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

**52 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..........................................

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා**

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 04 | |
| 02 | 05 - 11 | |
| 03 | 12 - 19 | |
| 04 | 20 - 25 | |
| 05 | 26 - 39 | |
| 06 | 40 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**උපදෙස්:**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

- අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

1. "ශ්‍රී ලංකාවේ නව නර්තන කලාවේ පුරෝගාමීයෝ" යන කෘතිය රචනා කරන ලද්දේ,
   (1) ලයනල් බෙන්තරගේ සහ ජයසේන කෝට්ටගොඩ ය.
   (2) ලයනල් බෙන්තරගේ සහ එදිරිවීර සරච්චන්ද්‍ර ය.
   (3) මුදියන්සේ දිසානායක සහ එදිරිවීර සරච්චන්ද්‍ර ය.
   (4) මුදියන්සේ දිසානායක සහ තිස්ස කාරියවසම් ය.
   (5) තිස්ස කාරියවසම් සහ ආරියරත්න කලුආරච්චි ය. (.........)

2. යාදිනි මාත්‍රය, මුදුන් තාලය හා තොරන් යාගය අයත් වන්නේ කුමන නර්තන සම්ප්‍රදායට ද?
   (1) උඩරට
   (2) පහතරට
   (3) සබරගමු
   (4) සබරගමු හා පහතරට
   (5) පහතරට හා උඩරට (.........)

3. කොහොඹා යක් කංකාරිය ශාන්තිකර්මයේ චාරිත්‍ර විධියක් ලෙස සැලකෙන්නේ,
   (1) තොට පේ කිරීම සහ මිල්ල පේ කිරීම ය.
   (2) තොට පේ කිරීම සහ බිසෝ කප සිටුවීම ය.
   (3) මල පේ කිරීම සහ බිසෝ කප සිටුවීම ය.
   (4) හඟලේ යැදීම සහ අයිලේ යැදීම ය.
   (5) හඟලේ යැදීම සහ මිල්ල පේ කිරීම ය. (.........)

4. දෙවොල් ගොඩබැසීම, අඹ විදමන හා මරා ඉපැද්දීම යන නාට්‍යමය අවස්ථා දැකිය හැක්කේ,
   (1) ගී මඬුවේ දී ය.
   (2) දෙවොල් මඬුවේ දී ය.
   (3) සූනියම් කැපීමේ දී ය.
   (4) සන්නියකුමේ දී ය.
   (5) කොහොඹා කංකාරියේ දී ය. (.........)

[දෙවැනි පිටුව බලන්න

Department of Examinations, Sri Lanka

5. බලි ශාන්තිකර්මයේ දී භාවිත පන්තිස් බලි කවිවලට අයත් වන්නේ,
(1) ඇඹුම් කවි, බලි සැරසුම සහ නැකත් විසිහතේ කවි ය.
(2) ඇඹුම් කවි, බලි සැරසුම සහ පන්තේරු කවි ය.
(3) ඇඹුම් කවි, බලි සැරසුම සහ එරන්දතී වර්ණනාවේ කවි ය.
(4) නව ගුණ පිරිත, බලි සැරසුම සහ රන් තෙලඹුවේ කවි ය.
(5) නව ගුණ පිරිත, ඇඹුම් කවි සහ රාජ ස්තෝත්‍ර ය. (.........)

6. එක්දහස් නවසිය පනහේ සහ හැටේ දශකවල ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය ක්ෂේත්‍රයට ප්‍රබල දායකත්වයක් දුන් ශිල්පීන් ලෙස වැදගත් වන්නේ,
(1) ප්‍රේම කුමාර එපිටවෙල, චිත්‍රසේන ඩයස් සහ ඩබ්ලිව්. බී. මකුලොලුව ය.
(2) ප්‍රේම කුමාර එපිටවෙල, චිත්‍රසේන ඩයස් සහ වසන්ත කුමාර ය.
(3) චිත්‍රසේන ඩයස්, වසන්ත කුමාර සහ කුලසිරි බුදවත්ත ය.
(4) චිත්‍රසේන ඩයස්, ඒ. ඉඹුල්ගෙඩ සහ සෝමපාල මුදුන්කොත්ගේ ය.
(5) ඒ. ඉඹුල්ගොඩ, ජී. රංගනාත් සහ රවිබන්දු විද්‍යාපති ය. (.........)


7. දේශීය සංගීතය සඳහා භාවිත කරන අවනද්ධ භාණ්ඩ වන්නේ,
(1) උඩැක්කිය, තාලම්පට, දඬුබෙරය හා තබ්ලාවයි.
(2) උඩැක්කිය, තාලම්පට, රබාන හා තම්මැට්ටමයි.
(3) උඩැක්කිය, ගැටබෙරය, රබාන හා තම්මැට්ටමයි.
(4) දෙවොල්බෙරය, ගැටබෙරය, රබාන හා කයිතාලමයි.
(5) දෙවොල්බෙරය, ගැටබෙරය, දඬුබෙරය හා තම්බෝරුවයි. (.........)

8. 'අපගේ මුණිරජාණන්' යන්නෙහි ඇති ලඝු හා ගුරු මත් ගණන කීය ද?
(1) ලඝු 09 හා ගුරු 02 කි.
(2) ලඝු 08 හා ගුරු 03 කි.
(3) ලඝු 05 හා ගුරු 04 කි.
(4) ලඝු 05 හා ගුරු 03 කි.
(5) ලඝු 04 හා ගුරු 03 කි. (.........)

9. ඉරුගල් බණ්ඩාර, කන්දේ බණ්ඩාර හා කළුකුමාර පුද ලබන්නේ,
(1) රටයකුම යාගයේ දී ය.
(2) දෙවොල් මඩුවේ දී ය.
(3) පහන් මඩුවේ දී ය.
(4) කොහොඹා කංකාරියේ දී ය.
(5) සූනියම් කැපිල්ලේ දී ය. (.........)

10. පිළිවෙළින් දේව කෝල්පාඩුව, දුනුමාලප්පුව හා ශුද්ධ මාත්‍රය යන ශාස්ත්‍රීය නර්තන අන්තර්ගතව ඇත්තේ,
(1) සබරගමු, උඩරට හා පහතරට සම්ප්‍රදායට ය.
(2) සබරගමු, පහතරට හා උඩරට සම්ප්‍රදායට ය.
(3) පහතරට, සබරගමු සහ උඩරට සම්ප්‍රදායට ය.
(4) පහතරට, උඩරට හා සබරගමු සම්ප්‍රදායට ය.
(5) උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායට ය. (.........)

11. පහත දැක්වෙන්නේ 'කෘෂ්ණ' චරිතය ඉස්මතු කෙරෙන භාරතීය නර්තන සම්ප්‍රදා තුනකි. එම නර්තන සම්ප්‍රදා පිළිවෙළින්,





(1) භරත, කථක් හා ඔඩිසි වේ.
(2) භරත, කථක් හා කථකලි වේ.
(3) මනිපුරි, කථක් හා කථකලි වේ.
(4) මනිපුරි, භරත හා කථකලි වේ.
(5) මනිපුරි, කථක් හා කුච්චිපුඩි වේ. (.........)

Department of Examinations, Sri Lanka

12. “විදෙන ලෙලෙන නරු බර පුළුලුකුලැ රැඳී” මෙම පද්‍ය පාදය ඇතුළත් වන්නේ කුමන යුගයට අයත් කවර සංදේශයක ද?
(1) ගම්පල යුගයේ මයුර සංදේශයේ
(2) ගම්පල යුගයේ තිසර සංදේශයේ
(3) කෝට්ටේ යුගයේ සැවුල් සංදේශයේ
(4) කෝට්ටේ යුගයේ සැළලිහිණි සංදේශයේ
(5) කෝට්ටේ යුගයේ හංස සංදේශයේ (.........)

13. දමිළ සංස්කෘතිය හා බැඳි ගැමි නර්තනවලට අයත් වන්නේ,
(1) උලවර් නඩනම්, කාවඩි සහ නාගස්වරම් ය.
(2) කෝලාට්ටම්, කුම්මි, චෙම්බු සහ සුලකු ය.
(3) කෝලාට්ටම්, කුම්මි, චෙම්බු සහ කුලු ය.
(4) කෝලාට්ටම්, පින්නල් කෝලාට්ටම්, චෙම්බු සහ ලී කෙළි ය.
(5) පින්නල් කෝලාට්ටම්, චෙම්බු, ළී කෙළි සහ ගොයම් ය. (.........)


14. සංඛපාල හා දං උදයාගේ කතා පුවත් පසුබිම් වී ඇත්තේ කුමන ශාන්තිකර්මයේ ද?
(1) උඩරට සම්ප්‍රදායේ කොහොඹා කංකාරියේ
(2) උඩරට සම්ප්‍රදායේ දෙවොල් මඩුවේ
(3) පහතරට සම්ප්‍රදායේ දෙවොල් මඩුවේ
(4) පහතරට සම්ප්‍රදායේ සන්නියකුම යාගයේ
(5) සබරගමු සම්ප්‍රදායේ පහන් මඩුවේ (.........)

15. නර්තනයේ පුද්ගල හා පොදු අවකාශ භාවිත මූලධර්ම මත යොදා ගන්නා තල හා දිසා සංඛ්‍යාව කීය ද?
(1) තල 3 දිසා 6 කි.
(2) තල 3 දිසා 10 කි.
(3) තල 4 දිසා 6 කි.
(4) තල 4 දිසා 7 කි.
(5) තල 4 දිසා 8 කි. (.........)

16. පහතරට සම්ප්‍රදායේ දෙවොල් මඩුවේ දොළහ පෙළපාළියට අයත් අංග **දෙකක්** වන්නේ,
(1) ඇත් බන්ධනය හා පොත්කඩේ පෙළපාළියයි.
(2) ඇත් බන්ධනය හා සැවුල් පෙළපාළියයි.
(3) ඇත් බන්ධනය හා චාමර පෙළපාළියයි.
(4) අඹ විදමන හා මී බන්ධනයයි.
(5) අඹ විදමන හා මී කැඩීමයි. (.........)

17. දේශීය නර්තනයට සෘජුව ම සම්බන්ධ වන අවනද්ධ භාණ්ඩ ලෙස සැලකෙන්නේ,
(1) ගැටබෙරය, තම්මැට්ටම, දවුල හා දඬුබෙරයයි.
(2) ගැටබෙරය, දෙවොල්බෙරය, දවුල හා දඬුබෙරයයි.
(3) ගැටබෙරය, පහතරටබෙරය, දවුල හා උඩැක්කියයි.
(4) ගැටබෙරය, උඩරටබෙරය, දවුල හා තම්මැට්ටමයි.
(5) උඩරටබෙරය, පහතරටබෙරය, තම්මැට්ටම හා දඬුබෙරයයි. (.........)

18. පහතරට ශාන්තිකර්ම හා සම්බන්ධ ඡායාරූප කිහිපයක් පහත දැක්වේ.





ඉහත ඡායාරූපවලින් දැක්වෙන්නේ, පිළිවෙළින්
(1) පන්දම්පාළිය, කපුයක්කාරිය සහ සළුපාළිය වේ.
(2) පන්දම්පාළිය, කපුයක්කාරිය සහ මරුසන්නිය වේ.
(3) සළුපාළිය, කපුයක්කාරිය සහ පන්දම්පාළිය වේ.
(4) සළුපාළිය, නානුමුරය සහ පන්දම්පාළිය වේ.
(5) මරු සන්නිය, නානු මුරය සහ පන්දම්පාළිය වේ. (.........)

19. භරත නාට්‍යම්වල නෘත්ත ගණයට වැටෙන ශාස්ත්‍රීය නර්තන අංග **දෙක** පිළිවෙළින්
(1) ජතීස්වරම් සහ වර්ණම් ය.
(2) ජතීස්වරම් සහ ශබ්දම් ය.
(3) ජතීස්වරම් සහ පදම් ය.
(4) අලාරිප්පු සහ පදම් ය.
(5) අලාරිප්පු සහ තිල්ලානා ය. (.........)


[හතරවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

**20.** තත්කාර්, සලාම්, ආමද්, පරන් යන පාරිභාෂික වචන භාවිත වන්නේ,
(1) උත්තර භාරතීය කථක් සම්ප්‍රදායේ ය.
(2) උත්තර භාරතීය මනිපුරි සම්ප්‍රදායේ ය.
(3) දක්ෂිණ භාරතීය කථක් සම්ප්‍රදායේ ය.
(4) දක්ෂිණ භාරතීය භරත සම්ප්‍රදායේ ය.
(5) දක්ෂිණ භාරතීය කථකලි සම්ප්‍රදායේ ය. (.........)

**21.** මනිපුරි නර්තනයේ කෘෂ්ණගේ රංග වස්ත්‍රාභරණ ලෙස සැලකෙන්නේ,
(1) සෙනකුජ්, රිෂම්පුරිට්, කොක්තුම්බි, කුම්මින් ය.
(2) පොෂ්වාන්, රිෂම්පුරිට්, කොක්තුම්බි, කුම්මින් ය.
(3) පොෂ්වාන්, රිෂම්පුරිට්, ක්වංගෝයි, කුම්මින් ය.
(4) ධෝතිය, රිෂම්පුරිට්, චුරා, ගුංගුරු ය.
(5) ධෝතිය, රිෂම්පුරිට්, චුරා, කුම්මින් ය. (.........)

**22.**



ඉහත දැක්වෙන කෝලම් වෙස් මුහුණු පිළිවෙළින්,
(1) පංචනාරි ඝටය, සුරඹවල්ලි, නාගරාක්ෂ සහ නාග කන්‍යා වේ.
(2) පංචනාරි ඝටය, නාරිලතා, සුරඹවල්ලි සහ නාග කන්‍යා වේ.
(3) සුරඹවල්ලි, ගිරිදේවී, නාගරාක්ෂ සහ නාග කන්‍යා වේ.
(4) නාරිලතා, සුරඹවල්ලි, නාග කන්‍යා සහ ගිරිදේවී වේ.
(5) නාරිලතා, පංචනාරි, නාග කන්‍යා සහ ගිරිදේවී වේ. (.........)

**23.** දොං දොං ජිං ජිං ගජිගත / දොම් තම් ගත ගදිතම් ගත / ජිං ජිමිකිට තත් කිටිතක යන බෙර පදය අයත් වන්නේ,
(1) මාත්‍රා 2 + 3 දෙතිතේ රූපයට ය.
(2) මාත්‍රා 2 + 4 දෙතිතේ රූපයට ය.
(3) මාත්‍රා 3 + 3 දෙතිතේ රූපයට ය.
(4) මාත්‍රා 3 + 4 දෙතිතේ රූපයට ය.
(5) මාත්‍රා 4 + 4 දෙතිතේ රූපයට ය. (.........)

**24.** කථකලි නර්තනයේ කතාපුවත් සඳහා ආභාසය ලැබූ ග්‍රන්ථ ලෙස සැලකෙන්නේ,
(1) භගවත්ගීතාව සහ අභිනය දර්පණයයි.
(2) මහාභාරතය සහ පංචතන්ත්‍රයයි.
(3) මහා භාරතය සහ රාමායනයයි.
(4) රාමායනය සහ අභිනය දර්පණයයි.
(5) අභිනය දර්පණය සහ පංචතන්ත්‍රයයි. (.........)

**25.** ඉදිරිපස රූපයෙන් දැක්වෙනුයේ,
(1) සන්නියකුම් විදිය සහ සළුපාළියයි.
(2) සන්නියකුම් විදිය සහ පන්දම්පාළියයි.
(3) සූනියම් වීදිය සහ පන්දම්පාළියයි.
(4) සන්නියකුම් විදිය සහ වඩිග පටුනයි.
(5) සූනියම් වීදිය සහ වඩිග පටුනයි. (.........)





Department of Examinations, Sri Lanka

● අංක **26** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා **හිස්තැන් පුරවන්න.**

**26.** හින්දුස්ථානි සංගීතයේ තාල අතුරින්............................ දේශීය තාල පද්ධතියෙහි මහ තනි තිතට සමාන කළ හැකි ය.

**27.** අසුර යක්කම සහ පොත්කඩේ යක්කම අන්තර්ගතව ඇත්තේ ................................ නර්තන සම්ප්‍රදායට ය.

**28.** අ.පො.ස. (උසස් පෙළ) විභාගයට නර්තන විෂය ප්‍රථම වතාවට ඇතුළත් කරන ලද්දේ ................................ වර්ෂයේ දී ය.

**29.** ගම්වල සැම තැන ඇවිද ගොසින්නේ
වෙල්ලාවට රෙදි අසුරා ගන්නේ
සොඳ සඳ පිරුවට වියන් බඳින්නේ
පේඩි රාළ වද සබේ නටන්නේ

මෙහි පේඩි රාළ ලෙස හඳුන්වන්නේ කෝලම්වල එන ............................................. චරිතය වේ.

**30.** "නිතිනි දන මන නයන පිනවන දුල් සිරින දෙවඟනක විලසා" මෙම කවි පාදය අයත් වන්නේ .............................. සවුදමට ය.

**31.** වැදි යකුන් හා මෙලෙයි යකුන් පුද ලබන්නේ ................................ ශාන්තිකර්මයේ දී ය.

**32.** කළු යකාගේ වස්ත්‍රාභරණ සඳහා ප්‍රධාන වශයෙන් කළු වර්ණය යොදා ගන්නා අතර රීරි යකාගේ වස්ත්‍රාභරණ සඳහා ......................... වර්ණය යොදා ගනී.

**33.** නර්තනයේ මාධ්‍යය චලනය වේ නම්, චිත්‍ර කලාවේ මාධ්‍යය ................................ ලෙස සැලකේ.

**34.** "ආංගිකම් භුවනම් යස්‍ය වාචිකම් සර්වවාංමයම්
ආහාර්යම් චන්ද්‍ර තාරා දි තං නුමඃ සාත්විකම් ශිවම්"

මෙම ශ්ලෝකය ................................ නමස්කාරය ලෙස හැඳින්වේ.

**35.** බටහිර බැලේ නර්තනය ඉතාලියේ ප්‍රභවය වූයේ ................................ වන ශතවර්ෂයේ දී ය.

● අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර **තිත් ඉර** මත ලියන්න.

**36.** පහත සඳහන් පුද්ගලයින් දායකත්වය ලබා දුන් නර්තන සම්ප්‍රදායන් මොනවා ද?

(i) ජමොරින් රජ : ................................ (ii) රවින්ද්‍රනාත් තාගෝර් : ................................

**37.** පහත සඳහන් භාරතීය නෘත්‍ය නාටක නිර්මාණකරුවෝ කවරහු ද?

(i) රාධා ක්‍රිෂ්ණා, රාම් ලීලා : ................................................

(ii) කල්පනා, ජීවනයේ රිද්මය : ................................................

**38.** පත්තිනිය හා සූනියම් යක්ෂණිය පැමිණෙන අවස්ථා දෙක ඇතුළත් ශාන්තිකර්ම **දෙක** නම් කරන්න.

(i) පත්තිනිය: ................................................

(ii) සූනියම් යක්ෂණිය :................................................

**39.** "............. ලැබ ගෙන - කස්තාන ගෙන පැලඳ ගෙන
බස්තම අතට ගෙන - රාළහාමි සබේ වඩිමින"


මෙම කවිය අයත් වන ගැමි නාටකය හා චරිතය නම් කරන්න.

(i) ගැමි නාටකය: ................................................

(ii) චරිතය :................................................

[හයවැනි පිටුව බලන්න

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

40. 


(i) A කොටසට අයත් වර්ණය කුමක් ද?: ..............................

(ii) B සහ C සංයෝගයෙහි ඇති වර්ණය කුමක් ද? :..............................

41. ජී. වී. හීන් නිලමේ සහ සචිරිස් සිල්වා යන නර්තන ශිල්පීන් ප්‍රවීණත්වය දැක්වූයේ කුමන නර්තන සම්ප්‍රදායවලට ද?

(i) ජී. වී. හීන් නිලමේ :.............................. (ii) සචිරිස් සිල්වා :..............................

42. පරෙවිය හා රන්දද මුද්‍රා නාට්‍ය දෙක නිෂ්පාදනය කළ ශිල්පීන් **දෙදෙනා** කවු ද?

(i) පරෙවිය: .............................. (ii) රන්දද :..............................

43. පහත දැක්වෙන නර්තනාංග අයත් වන්නේ කුමන සම්ප්‍රදායවලට ද?

(i) ශුද්ධ මාත්‍රය: .............................. (ii) මුල් මාත්‍රය :..............................

44. ගඩලාදෙණිය විහාරය හා ඇම්බැක්කේ දේවාලය වඩාත් ප්‍රචලිතව ඇත්තේ කුමන රූකම් සඳහා ද?

(i) ගඩලාදෙණිය : ..............................

(ii) ඇම්බැක්කේ : ..............................

45. කරදිය මුද්‍රා නාට්‍යයේ මණ්ණඩි රාළගේ චරිතය සහ සිසීගේ චරිතය ප්‍රථමයෙන් රංගනය කරන ලද ශිල්පියා සහ ශිල්පිණිය නම් කරන්න.

(i) මණ්ණඩි රාළ: .............................. (ii) සිසී :..............................

46. නාට්‍ය ශාස්ත්‍රය සහ අභිනය දර්පනය ග්‍රන්ථ දෙක රචනා කළ භාරතීය පඬිවරුන් **දෙදෙනා** කවු ද?

(i) නාට්‍ය ශාස්ත්‍රය: .............................. (ii) අභිනය දර්පනය :..............................

47. කර්ණාටක තාල පද්ධතියෙහි එන චතුරශ්‍ර ජාති හා තිශ්‍ර ජාතිවලට අයත් මාත්‍රා සංඛ්‍යාව දක්වන්න.

(i) චතුරශ්‍ර ජාති: .............................. (ii) තිශ්‍ර ජාති :..............................

48. ඉලතාලම් හා මංජීරා යන වාද්‍ය භාණ්ඩ දෙක භාවිත කරන භාරතීය නර්තන සම්ප්‍රදා **දෙක** නම් කරන්න.

(i) ඉලතාලම්: .............................. (ii) මංජීරා :..............................

49. තෙල් – – / ගා – ලා – / හි – ස – /

පී – – / රන් – – / තෑ – – – / නෝ ...

මෙම කවි පාදයට අයත් හීමත් ගණන හා සඳැස්මත් ගණන කීය ද?

(i) හීමත්: .............................. (ii) සඳැස්මත් :..............................

50. "කුමරා හංසයාට දුන්නෙන් විදීමට සැරසෙනවාත් සමග ම හංසයා එම ස්ථානයෙන් මඳක් ඉවතට ඉගිලී යයි. එම අවස්ථාවේ දී ම හංසයා කාන්තාවක් බවට පත්වෙයි. කුමරා මෙම අපූර්ව සිද්ධියෙන් පුදුමයට පත්වන අතර දුනු හී බිම තබා කාන්තාව දෙසට නික්ම යයි." මෙයින් උද්දීපනය වන භාවය හා රසය නම් කරන්න.

(i) භාවය: .............................. (ii) රසය :..............................

* * *

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

15081

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2017**

| | | |
|---|---|---|
| **නර්තනය - (දේශීය) II**<br>நடனம் - (தேசிய) II<br>Dancing - (Indigenous) II | **52 S II** | ***පැය තුනයි***<br>*மூன்று மணித்தியாலம்*<br>*Three hours* |

**උපදෙස්:**

* **I** වන කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II, III, IV** කොටස්වලින් **එක්** ප්‍රශ්නය බැගින් ද තෝරා ගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයක ම **(i)** කොටසට ලකුණු **06** ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08** ක් ද වශයෙන් මුළු ලකුණු **20** ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා ගෙන, ප්‍රස්තාර කරන්න.

(අ) "තකුං ජිං ජිං තක ජිං ගත රුජිං කඩතක"
(ආ) "තක දිත් තක දොම් දොං දිං තකදොම්"
(ඇ) "ජිං ජිං තත් ජිමිතක ජිමිකත"

(ii) පහත සඳහන් කවි පදය මාත්‍රා තුනේ, තනි තිතේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

"ඉපල් පිටින් ගහන අච්ච පිටට ඉහිරවන්නේ...
තාදිඟු තරි යේ දිගු තරි ඒක එහෙම වන්නේ"

(iii) මයුරා වන්නමේ අඩව්ව/ශුද්ධ තාලයේ ඉරට්ටිය/නාග ගජගා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

**2.** "ශාන්තිකර්මවල දී සාම්ප්‍රදායික නර්තනවල ආවේණික ලක්ෂණ, විවිධතා හා සමානතා මෙන් ම සමාජ සම්බන්ධතා ද මැනවින් විද්‍යමාන වේ."

(i) පහතරට නර්තන සම්ප්‍රදායේ රටයකුම හා දෙවොල් මඩු ශාන්තිකර්මයන්හි නාට්‍යමය පෙළපාළිවල චරිත නිරූපණ අවස්ථා **දෙකක්** ඇසුරෙන් ඉහත පාඨය සනාථ කරන්න.

(ii) සමාජ සම්බන්ධතා හා සාර්ධර්ම එදිනෙදා ජීවිතය හා බැඳෙන ආකාරය කොහොඹා යක් කංකාරිය ශාන්තිකර්මය ඇසුරෙන් විග්‍රහ කරන්න.

(iii) පුරාවෘත්ත මගින් හෙළි වන බෞද්ධාගමික පසුබිම හා සමාජ විශ්වාස සන්නියකුම යාගය ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

**3.** අභිනය යන සංකල්පය දේශීය ශාන්තිකර්මවල ප්‍රාසංගික බව වර්ධනය කිරීමෙහිලා බෙහෙවින් බලපාන සාධකයක් වේ.

(i) කොහොඹා කංකාරියේ සතර අභින උපයෝගීතාව ඉහත පාඨය මගින් සාකච්ඡා කරන්න.

(ii) බලි ශාන්තිකර්මයේ ඇති සෞන්දර්යාත්මක වටිනාකම ආහාර්ය අභිනය ඇසුරෙන් විග්‍රහ කරන්න.

(iii) දෙවොල් මඩුව හෝ පහන් මඩුව ශාන්තිකර්මයේ ප්‍රාසංගික බව තීව්‍ර කිරීමෙහිලා වාචික හා ආහාර්ය අභිනය යොදා ගන්නා ආකාරය නාට්‍යමය අවස්ථාවක් මගින් විමසීමට ලක් කරන්න.

## II කොටස

**4.** දේශීය නර්තනය ව්‍යාප්ත කිරීමේ දී යුගාන්තර වශයෙන් විවිධ සාධක බලපා ඇති බව ඓතිහාසික තොරතුරු මගින් ගම්‍ය වේ.

(i) උඩරට වන්නම්වල ප්‍රභවය හා විකාශය පිළිබඳ තොරතුරු සවිස්තරාත්මකව සපයන්න.

(ii) "නර්තන කලාවේ ව්‍යාප්තිය පිළිබඳ විමර්ශනය කිරීමේ දී දේශාටන වාර්තා ද වඩා වැදගත් වේ." නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(iii) ක්‍රි. ව. 1980 න් පසු දේශීය නර්තනයේ ඇති වූ සමාජීය වෙනස්කම් පිළිබඳ විමසීමක් කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

5. (i) සොකරි නාටකයේ එන චරිත **දෙකක්** නම් කර, එම එක් එක් චරිතයට භාවිත බෙර පදය හා කවිය බැගින් ලියන්න.

(ii) "ගැමි නැටුමට ආවේණික සුවිශේෂ ලක්ෂණ මෙන් ම, ඒ හා බැඳි ගායනාවලින් ඔවුන්ගේ ජීවන රටාව පිළිබිඹු වේ." නිදර්ශනාත්මකව විග්‍රහයක් කරන්න.

(iii) කෝලම් චරිත නිරූපණය සඳහා නර්තනය යොදා ගෙන ඇති ආකාරය චරිත **දෙකක්** ඇසුරෙන් විශ්ලේෂණය කරන්න.

## III කොටස

6. පහත සඳහන් වගුවෙහි (අ),(ආ),(ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට වෙන වෙන ම පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| ශ්‍රීමති මේනකා | පදම් | පුංග් - පෙනා |
| රුක්මණී දේවී අරුන්ඩේල් | ලායිහරෝබා | චෙන්ඩා - එඩැක්ක |
| බාලසරස්වතී | තෝඩායම් | මෘදංගම් - නටුවාංගම් |
| නවාබ් වජිඩ් අලීෂා | ගත් නිකාස් | පක්වාජ් - තබ්ලා |

(i) (අ) අඩයාර්හි කලා ක්ෂේත්‍රයට වඩාත් මෙහෙවරක් කළ ශිල්පිනිය කවුද? ඇය පිළිබඳ ඇගයීමක් කරන්න.

(ii) (ආ) කථකලි නර්තනයේ ශාස්ත්‍රීය නර්තන අංගය තෝරා, එම නර්තනය පිළිබඳ කරුණු දක්වන්න.

(iii) (ඉ) කථක් නර්තනය හා සබැඳි වාද්‍ය භාණ්ඩවල ව්‍යුහය හා ඒවායේ විශේෂතා ගෙනහැර දක්වන්න.

7. (i) රසභාව දැකිය හැකි අවස්ථාවක් රටයකුම හෝ සන්නියකුම ශාන්තිකර්මය ඇසුරෙන් විස්තර කරන්න.

(ii) බටහිර බැලේ (Ballet) සංකල්පය සහ දේශීය මුද්‍රා නාට්‍ය සංකල්පය සංසන්දනය කරන්න.

(iii) නල දමයන්ති මුද්‍රා නාට්‍යයේ නිර්මාණකරණයේ ශිල්පක්‍රම හා කලාත්මක ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

## IV කොටස

8. නව නර්තන කලාවේ ප්‍රවණතා දේශීය සාම්ප්‍රදායික නර්තනයේ ප්‍රවර්ධනයට බෙහෙවින් බලපා ඇත.

(i) සාම්ප්‍රදායික නර්තනය සෞන්දර්ය විෂයයක් වශයෙන් පාසල් අධ්‍යාපනයට එක් කිරීම සහ එහි ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

(ii) නව ප්‍රවණතා හමුවේ සාම්ප්‍රදායික නර්තන කලාව සංරක්ෂණය කළ හැකි ද? මේ පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

(iii) "චිත්‍ර කලාවේ මූලිකාංග නර්තන කලාව හා බැඳෙන අතර අද්‍යතන නිර්මාණවල එය වඩාත් ඉස්මතු වේ." ඇගයීමක් කරන්න.

9. (i) පැරණි හා නූතන රංග භූමි අලංකරණය හා විවිධ ශිල්පක්‍රම පිළිබඳ තුලනාත්මක ව පිරික්සන්න.

(ii) දේශීය ශාන්තිකර්මවල රංගභූමි අලංකරණයේ දී භාවිත වන අමුද්‍රව්‍ය, වර්ණ හා සැරසිලි පිළිබඳ විමසුමක් කරන්න.

(iii) "අද්‍යතන වේදිකාවේ දක්නට ලැබෙන වෙස් මෝස්තර හා රංගාලෝකය, නිර්මාණාත්මක නර්තනයේ ප්‍රාසංගික බවට වඩාත් ඉවහල් වේ." විග්‍රහයක් කරන්න.

* * *

Department of Examinations, Sri Lanka